# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2163/21 - 2020 පෙබරවාරි මස 19 වැනි බදාදා - 2020.02.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 21/78 (XV) (A)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

21 වන වගන්තිය සහ 139 වන වගන්තිය සමග කියවිය යුතු 27 (1) වන වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන, තාක්ෂණ සහ නවෝත්පාදන අමාත්‍ය ආචාර්ය බන්දුල ගුණවර්ධන වන මා විසින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත, මේ නියමය මගින් එකී පනතේ 139 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව සහ එකී පනතේ 21 වන වගන්තිය යටතේ පිහිටුවන ලද විශ්වවිද්‍යාලයක් ලෙස සලකනු ලැබිය යුතු වූ ශ්‍රී ලංකාවේ යාපනය විශ්වවිද්‍යාලයේ පීඨ සහ අධ්‍යයන අංශ නිශ්චිතව දක්වමින් (2019 සැප්තැම්බර් මස 02 වැනි දින අංක 2139/12 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමය මගින් අවසන් වරට සංශෝධිත) 2007 ඔක්තෝබර් මස 09 වැනි දින අංක 1518/15 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) එකී උපලේඛනයේ I වන තීරයේ දැක්වෙන "කලා පීඨය" යන අයිතමය සහ ඊට අනුරූපව එහි II වන තීරයේ දැක්වෙන සටහන් ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අයිතමය සහ සටහන් ආදේශ කිරීමෙන් :-

| *I වන තීරය* | *II වන තීරය* |
|---|---|
| "කලා පීඨය | 1. ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය |
| | 2. භූගෝල විද්‍යා අධ්‍යයන අංශය |
| | 3. දර්ශන විද්‍යාව පිළිබඳ අධ්‍යයන අංශය |
| | 4. වාග් විද්‍යාව සහ ඉංග්‍රීසි පිළිබඳ අධ්‍යයන අංශය |
| | 5. ක්‍රිස්තියානි සහ මුස්ලිම් ශිෂ්ටාචාරය පිළිබඳ අධ්‍යයන අංශය |
| | 6. දෙමළ භාෂාව පිළිබඳ අධ්‍යයන අංශය |
| | 7. ඉතිහාසය පිළිබඳ අධ්‍යයන අංශය |
| | 8. අධ්‍යාපනය පිළිබඳ අධ්‍යයන අංශය |
| | 9. ලලිත කලා පිළිබඳ අධ්‍යයන අංශය |
| | 10. දේශපාලන විද්‍යාව පිළිබඳ අධ්‍යයන අංශය |
| | 11. සමාජ විද්‍යාව පිළිබඳ අධ්‍යයන අංශය |

1A - PG 4883 — 518 (2020/02)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(සම්බන්ධිතයි)

| *I වන තීරය* | *II වන තීරය* |
| --- | --- |
| | 12. නැටුම් පිළිබඳ අධ්‍යයන අංශය (ආර්.ඒ.එෆ්.ඒ)* |
| | 13. සංගීතය පිළිබඳ අධ්‍යයන අංශය (ආර්.ඒ.එෆ්.ඒ)* |
| | 14. නීති අධ්‍යයන අංශය |
| | 15. ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ අධ්‍යයන අංශය |
| | 16. මාධ්‍ය අධ්‍යයන අධ්‍යයනාංශය |
| | 17. භාෂා පරිවර්තන අධ්‍යයන අධ්‍යයනාංශය |
| | * රාමනාදන් ලලිත කලා ඇකඩමිය'' ; සහ |

(2) එහි I වන තීරයේ දැක්වෙන "විද්‍යා පීඨය" යන අයිතමයට අනුරූපව එහි II වන තීරයේ සඳහන් වන "7. ධීවර අධ්‍යයන අංශය" යන සටහනට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් සටහන එකතු කිරීමෙන් :-

"8. පරිගණක විද්‍යාව අධ්‍යයන අංශය".

ආචාර්ය බන්දුල ගුණවර්ධන,
උසස් අධ්‍යාපන, තාක්ෂණ සහ නවෝත්පාදන අමාත්‍ය.

2020 පෙබරවාරි මස 18 වැනි දින,
කොළඹ දී ය.

03 - 131

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.